# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2153/5 - 2019 දෙසැම්බර් මස 09 වැනි සඳුදා - 2019.12.09**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

### ඌව පළාතේ පළාත් සභාව

ඌව පළාත් ආණ්ඩුකාරවරයා විසින් කරනු ලබන පත්කිරීම්

1987 අංක 42 දරන පළාත් සභා පනතේ 32(1) වැනි වගන්තිය යටතේ, ඌව පළාත් ආණ්ඩුකාරවර මෛත්‍රී ගුණරත්න මැතිතුමා විසින්, පහත සඳහන් පත්කිරීම් සිදු කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

01. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වන ශ්‍රේණියේ නිලධාරිණී ආර්. එච්. සී. ප්‍රියන්ති මහත්මිය, තම නිත්‍ය තනතුරේ රාජකාරිවලට අතිරේකව 2019.08.01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි ඌව පළාත් සමාජ සේවා අධ්‍යක්ෂ තනතුරේ වැඩ බැලීමට.

02. ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ I වන ශ්‍රේණියේ නිලධාරි ඉංජිනේරු ඩී. චන්ද්‍රතිලක මහතා, වහාම ක්‍රියාත්මක වන පරිදි, (2019.10.29 දින සිට) ඌව පළාත් මාර්ග අධ්‍යක්ෂ තනතුරට පත් කිරීම.

03. ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ II වන ශ්‍රේණියේ විශ්‍රාමික නිලධාරි පී. ඩබ්. ඩබ්. දිසානායක මහතා, 2019.10.24 වන දින සිට 2020.02.23 වන දින දක්වා හෝ ඌව පළාත් ආයුර්වේද කොමසාරිස් තනතුර සඳහා ස්ථිර නිලධාරියෙකු පත් කරන දිනය යන දින දෙකෙන් කලින් එළඹෙන දිනය දක්වා පමණක් කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ යෙදවීම.

04. ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ I වන ශ්‍රේණියේ නිලධාරි කේ. ඒ. බී. සෙනවිරත්න මහතා, 2019.10.26 වන දින සිට නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) තනතුරේ පූර්ණ කාලීනව වැඩ බැලීමට.

05. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරි දයානන්ද රත්නායක මහතා, 2019.07.22 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි, ඌව පළාත් ක්‍රීඩා හා යෞවන කටයුතු, සංචාරක, ප්‍රවාහන, සංස්කෘතික සහ පේෂ කර්මාන්ත හා කුඩා කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම් තනතුරට පත්කිරීම.

ආර්. එම්.ටී. බී. හාතියල්දෙණිය,
ඌව පළාත් ආණ්ඩුකාරවර ලේකම්.

2019 දෙසැම්බර් මස 06 වැනි දින,
ඌව පළාත් ආණ්ඩුකාරවර කාර්යාලයේ දී ය.

12-801/1

## ඌව පළාතේ පළාත් සභාව

### ඌව පළාත් ආණ්ඩුකාරවරයා විසින් කරනු ලබන පත්කිරීම්

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 154 (ඇ) වගන්තිය අනුව ආණ්ඩුකාරවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, ඌව පළාත් ආණ්ඩුකාරවර මෛත්‍රී ගුණරත්න මැතිතුමා විසින්, 2016 අංක 01 දරන ඌව පළාත් සභාවේ සමුපකාර සේවක කොමිෂන් සභා (සංශෝධන) ප්‍රඥප්තියෙන් සංශෝධිත, ඌව පළාත් සභාවේ 2010 අංක 04 දරන පළාත් සමුපකාර සේවක කොමිෂන් සභා ප්‍රඥප්තියේ 05 වන වගන්තියේ බලතල ප්‍රකාරව, ඌව පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාවේ සාමාජිකයකු ලෙස පහත සඳහන් පත්කිරීම් සිදු කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

| *නම සහ ලිපිනය* | *තනතුර* | *පත්වීම් දිනය* |
|---|---|---|
| පී. පද්මාවතී මහත්මිය,<br>අංක 48/9, කලාලියද්ද, උද්භිද උද්‍යාන පාර,<br>බදුල්ල. | ඌව පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාවේ සාමාජික | 2019.11.01 දින සිට වසර 03 ක කාලයක් සඳහා |

ආර්. එම්.ටී. බී. හාතියල්දෙණිය,
ඌව පළාත් ආණ්ඩුකාරවර ලේකම්.

2019 නොවැම්බර් මස 01 වැනි දින,
ඌව පළාත් ආණ්ඩුකාරවර කාර්යාලයේ දී ය.

12-801/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.